

# බුද්ධ ධර්මය

## 07 ශ්‍රේණිය



# 03.බුදුගුණ දැන සිත් සනසමු

- බුදුගුණ නවයකි



# බුදුගුණ මෙනෙහි කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල

- බුදුගුණ ප්‍රකාශ කරන, මෙනෙහි කරන, වන්දනා කරන තැනැත්තා තුළ සැදැහැවත් බව වැඩිදියුණු වෙයි.
- බුදුරදුන් පිළිබඳ විශාල ගෞරවයක් ද පැහැදීමක් ද සිත තුළ උපදී.
- සිත එක්තැන් වේ.
- නිවන් මගට පිවිසේ.
- සසර බොහෝ සැප ලබන්නට උපකාරී වන පින් දහම් රැස්කර ගැනීමට හැකි වේ.
- බිය, තැති ගැනීම ආදියෙන් අත් මිදීමට හැකි වේ.


- නව අර්හාදී බුදුගුණ පිළිබඳ බුදුගුණාලංකාරයේදී විස්තර සහිතව කවියෙන් දක්වා ඇත.
  - බුදුගුණාලංකාරයේ කර්තෘ-

    වීදාගම මහා මෛත්‍රේය හිමි

  රචිත යුගය-

    කෝට්ටේ යුගය

- එහි විශේෂත්වය නව අර්හාදී බුදුගුණ කවි 10 කින් දක්වා තිබීමයි.






# අරහං බුදුගුණය

- බුදුරදුන් රහසින්වත් පව් නොකළ නිසාද සියලු කෙලෙසුන් නැසූ නිසා ද සියලු පුද පූජාවන් ලැබීමට සුදුසු නිසාද අරහං නම් වේ.

01

රහසත් පවු නො කොට
කෙලෙසරයනුත් දුරු කොට
නිසි වූයෙන් පුදට
අරහ යැයි නම කියති මුනිදුට

# සම්මා සම්බුද්ධ බුදුගුණය

* බුදුරදුන් තුන්කාලයටම අයත් සියලු දේ අත්ලෙහි වූ නෙල්ලි ගෙඩියක් මෙන් මනාව දත් හෙයින් සම්මා සම්බුද්ධ නම් වේ.

02

| | |
|---|---|
| තුන් කල්හි ම | පැවැති |
| පදරුැත් සියල් ලොව | ඇති |
| අතැඹුල සෙ | දැනගති |
| එයින් සම්මා සම්බුදුන | යෙති |

# විජ්ජාචරණ සම්පන්න බුදුගුණය

* බුදුරදුන් අෂ්ට විද්‍යාවෙන්ද, ශීලාදී චරණ ධර්ම 15 කින් ද යුක්ත බැවින් විජ්ජාචරණ සම්පන්න නම් වේ.

03

විද්දෑ නැණ අට ද<br>
පසලොස් චරණ ගුණය ද<br>
ඇතියෙන් එමුනි සඳ<br>
පිරුණු විජ්ජාචරණ නම් ලද

# සුගත බුදුගුණය

* බුදුරදුන්, කෙලෙස් බිඳ දමා නිවනට ගමන් කළ නිසාත් යහපත් ගමන් ඇති නිසාත් සුන්දර වූ වචන ප්‍රකාශ කරන නිසාත් සුගත නම් වන සේක.

04

| | |
|---|---|
| යහපත් කොට | යෙතැයි |
| සුන්දර තැනට | සැපතැයි |
| සොදුරු බස් | කියතැයි |
| කියති ඒ මුනි රජුට | සුගතැයි |

# ලෝකවිදූ බුදුගුණය

* බුදුරදුන් සියලු කෙලෙස් නසා තුන් ලොව පිළිබඳ මනා කොට දැන, නොදන්නා ලෝක ප්‍රජාවට ඉතා පැහැදිලි ලෙස දේශනා කළ නිසා ලෝකවිදූ නම් වේ.

05

තුන් ලොව තතු ලෙසට
දැනගෙන නොදත් මෙලොවට
දෙසුයෙන් නියම කොට
ලෝකවිදු යැයි කියති මුනිදුට

# අනුත්තර පුරිසදම්මසාරථී බුදුගුණය

බුදුරදුන්, දමනය කළ නොහැකි දරුණු පුද්ගලයන් දමනය කළ නිසා අනුත්තර පුරිසදම්මසාරථී නම් වේ.

06

හැම ගුණයෙන් නදා
සම වැඩි සතකු හැමදා
දියතෙහි නැති සදා
අනුත්තර යැයි කියති මුනිදා

බඹ සුර යකුන් තද
දමනය කර තමන් ලද
සෙත් දී මුනිදු සඳ
පුරිසදම් සාරථී නම් ලද

# සත්ථා දේවමනුස්සානං බුදුගුණය

* බුදුරදුන්, දුකින් පෙලෙන සත්ත්වයන්ට නිවන් මඟ පෙන්වා දී සසර කතරින් එතෙරව නිවනට ළඟා වීමට තුන් ලොවටම මග පෙන්වූ ගුරුවරයා නිසා සත්ථා දේවමනුස්සානං නම් වේ.

07

බව කතරින් එතෙර
ලනුයෙන් සතන් හැම වර
තිලෝගුරු මුනිවර
වීය සත්තා නමින් පුවතර

# බුද්ධ බුදුගුණය

* බුදුරදුන්, චතුරාර්ය සත්‍යය තමා විසින් ම අවබෝධ කර , අන්‍යයන්ට කරුණාවෙන් අවබෝධ කරවීම නිසා බුද්ධ නම් වේ.

08

| | |
|---|---|
| සිව් සස් සිය | නැණින් |
| දැන දැන්වීය | කුලුණින් |
| දුරලයි | අනුවණින් |
| එබුදු නම් විය නැණ | පමණින් |

# භගවා බුදුගුණය

බුදුරදුන්, ධර්මය බෙදා දැක්වූ නිසා ද අනූන ගුණයෙන් යුතු නිසාද භාග්‍යවන්ත වූ නිසා ද භගවා නම් වේ.

09

බෙදුයෙන් දහම් කැඳ
බජනය කෙලෙන් ගුණ කැඳ
බග දහමින් සසැඳ
බැවින් බගවත් වීය මුනි සැඳ